තාක්ෂණික තොරතුරු පත්‍රිකාව

# කෘෂි තාක්ෂණ ලුහුඬින්

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

වෙළුම 9 අංක 3 2007 මැයි - ජූනි

## මෙවර කලාපයෙන්


- පැපොල් වගාවේ මුල් හා පාදස්ථ කුණුවීම වලක්වාගැනීම සඳහා ජල අපවහන පද්ධති යොදා ගැනීම
- ඉවත දමන පලතුරු වලින් කොම්පෝස්ට් සැකසීම
- මකද්කෙඳාක්කා විචිත්‍ර වෛරස් රෝගය පැතිරීම වළක්වමු.


**සංස්කරණය**
**ජයන්තා ඉලන්කෝන්**
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
තැ.පෙ. 18, පේරාදෙණිය

## පැපොල් වගාවේ මුල් හා පාදස්ථ කුණුවීම වලක්වාගැනීම සඳහා ජල අපවහන පද්ධති යොදා ගැනීම



*කාණු පද්ධතිය යොදා ඇති පැපොල් වගාවක්*



පාර්ශ්වික කාණුවක පිහිටීම



ප්‍රධාන අපවහන කාණුව

පැපොල් වගාව සඳහා බලපාන ප්‍රධාන රෝගී තත්වයකි. මුල් හා පාදස්ථ කුණුවීම. මෙම රෝගය නිසා පැපොල් වගාවට හා අස්වැන්නට සිදුවන හානි විශාල වේ. එබැවින් මෙය වලක්වා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අරලගංවිල පිහිටි ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය තුළ පර්යේෂණ වැඩසටහන් දියත් කළ අතර එමඟින් යෝග්‍ය ජල අපවහන පද්ධතියක් නිර්මාණය කර අත්හදා බැලිණි. එය ඉතා සාර්ථක ප්‍රතිඵල පෙන්විය.

වැසි අධික කාලයේදී (මෝසම් වැසි) හෝ වගාවේ මුල් අවධියේදී අධික තෙතමනය නිසා මුල් හා කඳේ පාදස්ථය කුණුවීම නිසා වර්ධනය අඩාලවීම හා වගා විනාශවීම

*2 වැනි පිටුවට*

## ඉවත දමන පලතුරු වලින් කොම්පෝස්ට් සකසමු

මෙරට පවතින පලතුරු බීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකසන කර්මාන්ත ශාලා වලින් හා ප්‍රධාන පලතුරු වෙළඳසැල් වලින් අපද්‍රව්‍ය ලෙස පලතුරු කොටස් විශාල වශයෙන් පරිසරයට මුදාහැරේ. දිරාපත් වීමට ලක්වෙන මෙම පලතුරු ඉවතලන කොටස් වලින් පස, වාතය, ජලය අපවිත්‍ර වීමත් එමගින් ඇති කරනු ලබන සෞඛ්‍ය තර්ජනත් මෙතෙකැයි පැවසිය නොහැක. එසේ හෙයින් හුදු අපද්‍රව්‍යයක් ලෙස ඉවත නොදමා ඉන් ප්‍රයෝජනයක් ලබා ගැනීමේ අරමුණින් ගොඩ ක්‍රමය මගින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඒවා යොදවා ගත හැකි අතර එහි ප්‍රතිඵලය ලෙස ඉතා උසස් කොම්පෝස්ට් පොහොරක් ජනතාවට ලබා දිය හැකිය.

ගොඩ ක්‍රමය මගින් කොම්පෝස්ට් සෑදීමට ගතවන කාලය ගොඩෙහි ප්‍රමාණය, අමුද්‍රව්‍ය වල ස්වභාවය, අමුද්‍රව්‍ය කැබලි වල ප්‍රමාණය, තෙතමනය හා කලවම් කරන වාර ගණන වැනි කරුණු මත රඳා පවතී.

**අවශ්‍ය අමුද්‍රව්‍ය:**

| | |
|---|---|
| පලතුරු ලෙලි (25% අන්නාසි කරඹු) | කි.ග්‍රෑ. 100 |
| ගොම | කි.ග්‍රෑ. 75 |
| ලී කුඩු | කි.ග්‍රෑ 25 |
| ග්ලිරිසිඩියා කොල/වැටමාර/ලාඩප්පා) | කි.ග්‍රෑ. 15 |

**සකස් කිරීම:**

සාදනු ලබන කොම්පෝස්ට් ගොඩ අධික හිරු එළියෙන් හා වර්ෂාවෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ආවරණ බිත්ති රහිත වහලක් සහිත ස්ථානයක ගොඩ සෑදිය යුතුය. සෑම අමුද්‍රව්‍ය වර්ගයක්ම සමාන කොටස් 4 කට

*3 වැනි පිටුවට*

**කෙතට අරුණ කෘෂිකර්ම ප්‍රවේශය තුළින් අලුත් ශ්‍රී ලංකාවක් බිහිකරමු**

බොහෝවිට දක්නට ලැබෙන්නකි. විශේෂයෙන්ම දුර්වල ජලවහනයක් සහිත බිම්වල හා භූ ජල මට්ටම ඉහලින් පිහිටි බිම්වල පැපොල් වගාවේදීත්, තැනිතලා බිම්වල වලවල් කපා පැපොල් වගා කිරීමේදීත් මේ තත්වය ඇති වේ.

මෙවැනි තත්වයක් ඇති වූ විට කාණු කැපීම හා මුල් කුණුවීම සඳහා දිලීර නාශක ඉසීම එතරම් ඵලදායී නොවන අතර නිර්දේශිත දිලීරනාශක යෙදීම මඟින් ගස නැවත යථා තත්වයට පත් වුවත් ගස දුර්වල වන අතර අස්වැන්න, සාපේක්ෂව අඩු වේ. අස්වැන්නේ ගුණාත්මයද අඩු වේ.

වගාව ආරම්භයේදීම සුදුසු අපවහන පද්ධතියක් නිර්මාණය කිරීම මඟින් මෙය ඉතාමත් සාර්ථක ලෙස වලක්වා ගතහැකි බව අරලගංවිල කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ මඟින් තහවුරු කර ඇත.

මෙම ක්‍රමය මඟින් නිරෝගි වගාවක් පවත්වාගතහැකි අතර, දිලීරනාශක භාවිතය අඩුවීමෙන් නිශ්පාදන පිරිවැය අඩුවීමත්, පැපොල් ගෙඩි තුළට විෂ කොටස් ඇතුල්වීම අවම වීමත් සිදු වේ. විශේෂයෙන් කාබනික පලතුරු වගාවේදී මෙය වැදගත් ප්‍රායෝගික සංකල්පයක් වන අතර එමඟින් රෝගවලට ප්‍රතිකාර කිරීමට වඩා වලක්වා ගැනීම අවධාරණය කෙරේ.

මූලපද්ධති අවට ජලය එක්රැස්ව පැවතීමට බලපාන සාධක කිහිපයකි.

1. නොගැඹුරු පස් සහිත බිම්වල, විශේෂයෙන් තැනිතලා බිම්වල භූගත ජලමට්ටම ඉහලට ගමන් කිරීම. මෙය වර්ෂාව නිසා හෝ ජල සම්පාදනයේදී ලැබෙන ජලයෙන් විය හැක.
2. දුර්වල ජලවහනයක් සහිත/තද පසක් සහිත බිම්වල ගැඹුරු වලවල් කපා පැපොල්පැළ රෝපණය කිරීම.

පැය 06 ට වඩා වැඩි කාලයක් මෙසේ පැපොල් ගස්වල මූල පද්ධතිය ජලයෙන් සංතෘප්තව පැවතීම නිසා මූල පද්ධතියේ සියුම් කොටස්වලට හානි සිදුවන අතර ජලාකාමි දිලීර වර්ග මුල්වලට ආසාදනයවීම සිදු වේ. එමඟින් ජලය හා පෝෂක සන්නයනය දුර්වලවන අතර ගස් මැලවීම හා පත්‍ර කහ පැහැවීමත්, පහල පත්‍ර හැලීයාමද සිදු වේ.

පයිටොප්තෙරා (Phytophthora) පීතියම් (Phythium) නම් වූ දිලීර ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරී වේ. දිලීර ආසාදනයෙන් පසු මුල් කුණුවීම ප්‍රධාන අතර කදේ පාදස්ථයද කුණුවීමට ලක් වේ. පසුව ගස් මැලවී මැරීයා හැක.

මූල පද්ධතිය ආසාදනය වූ කුඩා පැපොල් ගස් කඳෙන් අල්ලා සෙලවූ විට පහසුවෙන් ගැලවී එන අතර, මේරූ ගස් නම් පහසුවෙන් බිම පෙරලේ. මෙවැනි තත්වයක් ඇති වූ විට මෙතෙක් සිදුකළේ වගාව තුළ කාණු කපා ජලවහනය දියුණු කිරීම හා සුදුසු දිලීරනාශක මඟින් පස තෙත් කිරීමයි (මූල පද්ධති අවට). මෙහිදී මුල් වලට සිදු වූ හානිය අනුව යථා තත්වයට පත්වන ප්‍රතිශතය වෙනස් වේ. කෙසේ වෙතත් දිලීර ආසාදනයෙන් හා මුල් කුණුවීමෙන් දුර්වල ගස්වලින් ඉහල අස්වැන්නක් ලැබීමට නොහැක. එමෙන්ම දිලීර ආසාදනය නිසා ගෙඩි කුණුවීමේ තත්වයන්ද ඇතිවිය හැක.

එසේනම් කළයුත්තේ මෙවැනි තත්වයක් ඇතිවීම සම්පූර්ණයෙන් නවතා දැමීමට අවශ්‍ය පියවර ගැනීමයි. ඒ සඳහා

- භූජල මට්ටම ඉහලින් පවතින භූමිවල,
- වැස්සත් සමග හෝ ජල සම්පාදනයේදී භූජල මට්ටම ඉහලට ගමන් කරන දුර්වල ජලවහනය සහිත පස්වල හා
- ජලවහනය දුර්වල තද පසේ පැපොල් වගාවේදී නිවැරදිව බිම් සැකසීම හා ජලවහනය පූර්ණ වශයෙන් දියුණු කිරීම සඳහා කාණු පද්ධතියක් නිර්මාණය කිරීමයි. මේ සඳහා ශ්‍රමය හා අමතර පිරිවැයක් දැරිය යුතු වුවත් එමඟින් ලැබෙන ප්‍රතිඵලය ඉහළය.

පැපොල් වගාව බොහෝවිට වසර 2-3 කල් පවතින නිසා හොඳින් බිම් සැකසීම වැදගත්වන අතර සිදු කළයුත්තේ එම වසර 2-3 ටම එක් වරකි.

## පැපොල් වගාව සදහා නිවැරදිව බිම් සැකසීම හා ජලවහනය දියුණු කීම

*කාණු පද්ධතිය යොදා පැපොල් වගාවක ජල සම්පාදනය හා ජලවහනය වන අයුරු*




ජලවහනය දුර්වල හෝ තදපස් සහිත බිම්වල විශේෂයෙන් තැනිතලා බිම්වල පැපොල් වගාවේදී තැටි නගුල් හා කොකු නගුල් භාවිතා කරමින් සෙ.මී. 60 පමණ ගැඹුරට පස සකස් කිරීම යෝග්‍ය වේ. මෙහිදී පසට කාබනික පොහොර යෙදීමද කළ හැක. හෙක්ටයාර එකකට මෙට්‍රික්ටොන් 10 ක් පමණ වන ලෙස දිරාපත් වූ ගොම පොහොර හෝ කොම්පොස්ට් පොහොර බිම සකසන අවස්ථාවේ පසට යොදා පස සමඟ හොඳින් කලවම් කළ යුතුය (යන්ත්‍ර මඟින්). මෙහිදී වලවල්වලට කාබනික පොහොර යොදනවා වෙනුවට මුළු වගා බිමටම කාබනික පොහොර ඒකාකාරීව විසුරුවා හරියි. එමඟින් කාබනික පොහොර මඟින් වගාවට ලැබෙන ප්‍රතිලාභ වලට අමතරව පස තදවීම වලකා ජලවහනය දියුණු කිරීමත් සිදු වේ. ඉන්පසු උස් පාත්ති ආකාරයට කාණු යොදා සකස් කර ගත යුතුය. සෑම පැළ පේළියක් අතරටම සෙ.මී. 30 පමණ ගැඹුරු කාණු කපා පාත්ති සකස් කළ යුතුය. ගස් අතර පරතරය මීටර් 3x3 (අඩි 10x10) යෝග්‍ය අතර කාණු අතර පරතරයද එයම වේ. ඉන්පසු පාත්ති අතර තිබෙන කාණු සියල්ල සම්බන්ධ වන ලෙස පාර්ශ්වික කාණු සකස්කර ගතයුතු අතර මේවා සෙ.මී. 60-100ක් පමණ ගැඹුරින් විය යුතුය.

වැසි ජලය හොඳින් ඉවත්වීම සඳහා පතුල බෑවුම් ආකාරයට මෙම කාණු සකස්කර ගතයුතු අතර ප්‍රධාන කාණුවට සම්බන්ධ වන ස්ථානය සෙ.මී. 100 පමණ ගැඹුරු විය යුතුයි.

පාර්ශ්වික අපවහන කාණු අතර පරතරය මීටර් 10-20 අතර පවත්වාගත හැක. මෙයද භූමියේ ලක්ෂණ අනුව වෙනස් වේ.

ප්‍රධාන අපවහන කාණු භූමියේ ස්වභාවය අනුව මීටර් 50-100 පමණ පරතරයක් ඇතිව නිර්මාණය කළයුතු අතර බෑවුම ඇති දිශාවට සමාන්තරව නිර්මාණය කළයුතුය.

කාණුවල ගැඹුර තීරණය කිරීමේදී පොල් ගසේ මූලපද්ධතිය ගමන් කරන දුර සැලකිල්ලට ගෙන ඇත. බොහෝවිට පොල් ගසේ මුල් සෙ.මී. 60-100 පමණ ගැඹුරට ගමන්ගනී.

පොල් වගාවක මුල් හා පාදස්ථ කුණුවීම සඳහා බලපාන තවත් සාධකයකි මුල් හා කඳේ පාදස්ථය තුවාලවීම. මීට හේතුවනුයේ

1. පොහොර දැමීමේදී ප්‍රධාන මුල් කැපී තුවාලවීම
2. වල් මර්ධනය සඳහා උදළුගෑම නිසා ප්‍රධාන මුල් හෝ කඳ තුවාලවීම හෝ කැපීම

මෙම තත්වය වලක්වාගැනීමට එම කාර්යයන් සැලකිල්ලෙන් කිරීම වැදගත් වේ.

පොහොර දැමීමේදී ගසේ පත්‍රවලය පිහිටන වලයාකාර ප්‍රදේශයට පහලින් පොහොර දැමීම මඟින් මුල්වලට වන හානි අවම වන අතර, පොහොර හොඳින් උරාගැනීමද සිදු වේ. ඊට හේතු වනුයේ කුඩාමුල් විශාල වශයෙන් ඇත්තේ එම ප්‍රදේශයේ බැවිනි. ගසේ පාදස්ථයටම පොහොර දැමීම නුසුදුසුය.

වල් මර්ධනයේදීද මුල්වලට වන හානි අවම වීමට වගබලා ගත යුතුයි. කෙසේ වෙතත් මුල් තුවාලවීම නිසා දිලීර ආසාදන තත්වයක් ඇතිවූ වහාම සුදුසු දිලීරනාශක යෙදීම මඟින් තත්වය පාලනය කළ යුතුයි.

**මූලාශ්‍රය:**
ඩබ්.ඒ. විජිතවර්ණ (කෘ.මෙ.නි), එන්.ඩී. රණවක (කෘ.උ.)
කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
අරලගංවිල, පොළොන්නරුව

*1 වැනි පිටුවෙන්...*

බෙදා ගත 1 රූපසටහනේ ආකාරයට උණ බම්බු වලින් තනා ගත් වේදිකාවක් මතට අඟල් 1/2 කොටු සහිත කුකුල් දැලක් එලා ඒ මත ගොඩ සැදිය යුතුය.

සකසා ගත් එම වේදිකාව මත පළමුව පලතුරු අපද්‍රව්‍ය කොටසක් ද ඒ මත ගොම කොටසක් ද ඊටත් උඩින් ලී කුඩු කොටසක් ද අවසානයේ ග්ලිරිසීඩියා කොළ කොටසක් ද අතුරනු ලැබේ (රූප සටහන 2). මෙලෙස සකසා ගත් ගොඩ මත පෙර පරිදි ඉතිරි කොටස් පිළිවෙලින් පලතුරු ලෙලි අපද්‍රව්‍ය, ගොම, ලී කුඩු, සහ ග්ලිරිසීඩියා කොළ ආදී වශයෙන් අතුරාගත යුතුය. ගොඩ සම්පූර්ණයෙන් සාදාගත් පසු එහි දිග, පළල, හා උස පිළිවෙලින් මී. 3.5, මී. 2.5 හා මී. 1.5 ක් විය යුතු අතර, අවසානයේදී පොලිසැක් මලුවලින් ගොඩ වසා දමන්න. තෙතමනය 50-60% ලෙස පවත්වා ගන්න.




*රූපසටහන 02- ගොඩෙහි ස්ථර අනුපිළිවෙල*

මේ අනුව සකසා ගත් කොම්පෝස්ට් ගොඩ පලතුරු ලෙලි ස්ථර 4 ක් ද ගොම 4 ක් ද ලී කුඩු ස්ථර 4 ක් ද හා ග්ලිරිසීඩියා කොළ ස්ථර 4 ක් ද ලෙස අන්තර්ගත වේ.



*රූපසටහන 01 - උණ බම්බු වේදිකාව*

ගොඩ සැදූ දිනයේ සිට පිළිවෙලින් සති 2 කට හා සති 5 කට පසු ගොඩ හොඳින් පෙරලීම අනිවාර්ය වන අතර එමගින් සියළුම අපද්‍රව්‍ය හොඳින් මිශ්‍රවීම හා ගොඩ වාතනයද සිදුවේ. හොඳින් දිරාපත් වූ කොම්පෝස්ට් සෑදෙන තෙක් ගොඩේ උස මීටර් 1-1.5 ලෙස හා පළල මීටර් 2 ලෙස ද පවත්වා ගත යුතුය.

හොඳින් දිරාපත් වූ කොම්පෝස්ට් පවනේ වියලා, 20% තෙතමනය යටතේ මි.මී. 5 දැලකින් හලා භෝග වගා කිරීම සඳහා කාබනික පොහොරක් ලෙස භාවිතා කළ හැක.

මෙම ක්‍රමයෙන් හොඳින් දිරා ගිය ගුණාත්මයෙන් යුත් කොම්පෝස්ට් පොහොරක් ලබා ගැනීමට දින 61-64 ක් පමණ කාලයක් ගතවන අතර 20% තෙතමනය සහිත කි.ග්‍රෑ. 165-190 පමණ බරකින් යුත් කොම්පෝස්ට් ප්‍රමාණයක් නිපදවා ගත හැක.

ඉහත ද්‍රව්‍ය වලින් නිෂ්පාදිත කොම්පෝස්ට් හි pH අගය 8.4 විද්‍යුත් සන්නායකතාවය 0.005ds/m කාබන් 13.8% නයිට්‍රජන් 1.1% $P_2O_5$ 0.7% හා $K_2O$ 2.6% වේ. එබැවින් මෙම කොම්පෝස්ට්, ශාක වැඩීමට අවශ්‍ය ප්‍රධාන පෝෂක පදාර්ථ වන නයිට්‍රජන්, පොස්පරස්, හා පොටෑසියම් වලින් පොහොසත් වේ.

සාමාන්‍යයෙන් ප්‍රධාන පලතුරු බීම හා වෙනත් ඒ ආශ්‍රිත නිෂ්පාදන සහිත කම්හලකින් දිනකට ට්‍රැක්ටර් ලෝඩ් 4-5 ක් පමණ පලතුරු අපද්‍රව්‍ය ඉවතලන බැවින් එවැනි කම්හලක් අවට ජීවත්වන ගොවීන් හා ව්‍යවසායකයින් හට නොමිලේ පළතුරු අපද්‍රව්‍ය ලබා ගැනීමට හැකි බැවින් කොම්පෝස්ට් නිෂ්පාදනයට නැඹුරු කරවීමෙන් ඔවුන්හට හොඳ ආදායමක් ලබාගත හැකි අතර පරිසරය අපවිත්‍රවීමද වලක්වා ගත හැක.

*මූලාශ්‍රය:- දීපා වීරසූරිය*
*පර්යේෂණ නිලධාරී,*
*පළතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය*
*කනන්විල, හොරණ.*

# මඤ්ඤොක්කා විචිත්‍ර වෛරස් රෝගය පැතිරීම වළක්වමු.

අවම යෙදවුම් තුළින්, අඩු අවදානමක් යටතේ, ඒකක භූමි ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ලබා දෙන භෝගයක් ලෙස මඤ්ඤොක්කා හැඳින්විය හැකිය. වාණිජ භෝගයක් ලෙසද ගොවින් අතර ජනප්‍රිය භෝගයකි.

රෝග හා පළිබෝධ හානි අඩු භෝගයක් ලෙස හැඳින්විය හැකි වුවද, මෑතක සිට මඤ්ඤොක්කා වගාවට වැළදෙන විචිත්‍ර වෛරස් රෝගය දරුණු ලෙස වගාවට බලපෑම් ඇති කළ හැකි රෝගයක් ලෙස හඳුනා ගෙන ඇත. මෙය වැළඳුන විට භෝගයේ අස්වනු ප්‍රමාණය බොහෝ ලෙස අඩුවේ. මෙම රෝග තත්ත්වය පිළිබඳව පවතින අඩු අවදානය හේතුවෙන් මෙම රෝගය වගා බිම් වල සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින බැවින්, වාණිජ වශයෙන් කෙරෙන වගාවන් වලදී මෙය ගැටළුවක් බවට පත්වීම අනාගතයේ දී නොවැළැක්විය හැකි වේ.

මේ නිසා මෙම රෝගී තත්ත්වය හඳුනා ගැනීම හා පාලනය සඳහා පියවර ගැනීම කාලීනව ඉතා වැදගත් වේ.

### රෝග ලක්ෂණ:

පත්‍ර කහ කොළ විචිත්‍ර ලක්ෂණයක් පෙන්වීම සිදුවේ. පත්‍ර කොඩ වූ ස්වභාවයක් ගන්නා අතර, එම නිසා පත්‍ර ක්ෂේත්‍රඵලය අඩුවී යයි. ශාකයට අවශ්‍ය ආහාර නිපදවීමට ප්‍රමාණවත් තරම් පත්‍රවල ප්‍රමාණය විශාල නොවන බැවින්, ශාකය ක්‍රමයෙන් දුර්වල වී යයි. එනිසා අස්වැන්න අඩුවීමද සිදුවේ. මෙලෙම පත්‍රය විචිත්‍ර ස්වභාවයක් ගන්නා නිසා විචිත්‍ර වෛරස් රෝගය ලෙස හඳුන්වයි.





**රෝගී පත්‍ර**

### රෝගය පැතිරීම

- ප්‍රධාන ලෙස සුදු මැස්සා මාර්ගයෙන් රෝගය බෝවීම සිදුවේ. රෝගී ශාකයකින් යුෂ උරා බී නිරෝගී ශාකයකට ගොස් යුෂ උරා බීමේදී නිරෝගී ශාකයට රෝගය වැළඳීම සිදුවේ.
- ප්‍රචාරණය සඳහා රෝගී අතු කැබලි භාවිතා කිරීමෙන්ද රෝගය පැතිරීම සිදුවේ.
- වෛරස් රෝගයට ගොදුරු වූ වෙනත් ධාරක ශාක මගින්ද මඤ්ඤොක්කා වගාවට රෝගය බෝවීම සිදුවිය හැකිය.

### රෝග පාලනය:

- නිරෝගී වගාවකින් ලබා ගන්නා ලද දඬු කැබලි පමණක් සිටුවීම සඳහා භාවිතා කිරීම.
- රෝගය වැළදී ඇති බවට හඳුනාගත් ශාක හැකි ඉක්මණින් ගලවා පුලුස්සා දැමීම.
- වගාවේ හා වගාව අවට වල් පාලනය නිසි ලෙස සිදු කිරීම හා ක්ෂේත්‍රය පිරිසිදුව තබා ගැනීම.
- මෙම වෛරසය වැළදෙන වෙනත් ධාරක ශාක ලෙස හඳුනාගෙන ඇති වල් මඤ්ඤොක්කා, වල් කරාබු, වතුපාලු, වල් රබර් හා කුප්පමේනියා වැනි ශාක වගා ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම.
- ක්ෂේත්‍රයේ සුදු මැස්සන් සිටී නම් ඔවුන් පාලනය සඳහා කටයුතු කිරීම.
- රෝගී වගාවක් පවතින භූමියකට ආසන්නයේ නව වගාවක් ආරම්භ නොකිරීම හා එවැනි අවස්ථාවල පළමුව රෝගී වගාවේ පැරණි ගස් සියල්ල ගලවා විනාශ කිරීම.
- රෝග පැළ ඉවත් කිරීමට ගන්නා උපකරණ පිරිසිදු කර ගැනීමෙන් පසු පමණක් වගා කටයුතු සඳහා යොදා ගැනීම.

මෙම කරුණු නිසි ලෙස ක්‍රියාවට නැංවීම තුළින් මෙම වෛසරය පැතිරීම පාලනය කර, නිරෝගී වගාවක් පවත්වා ගෙන යාමට හැකිවනු ඇත.

ඔබට මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම්, පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකිය.

ස්ථාන භාර නිලධාරී
පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය
ගබඩාවත්ත - හෝමාගම
දුරකථන/ෆැක්ස් - 011/2895598

*මූලාශ්‍රය: පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයේ ප්‍රකාශනයක් ඇසුරෙනි.*